**නුවරඑළිය ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.1 ඡේදයේ (අ), (ආ), (ඇ), (ඈ),(ඉ),(ඊ) සහ (එ) ඡේදයේ නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ
---------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.424,851 ක ස්ථාවර වත්කම් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණු අතර රු.664,000 ක යන්ත්‍රයක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. එසේම රු.654,787 කට මිලදී ගෙන තිබුණු ජලනල උපාංග ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද තොගය රු.190,363 ක් වැඩියෙන් හා ලිපිද්‍රව්‍ය තොගය රු.696,770 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ මුද්දර බදු ආදායම් රු.6,028,112 ක් අඩුවෙන් බිල් කිරීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | 2020 හා 2021 වර්ෂ ලැබිය යුතු උසාවි දඩ රු.498,375 කින් වැඩියෙන් දක්වා තිබු අතර 2024 වර්ෂයේ අවස්ථා 23කදී ගෙවන ලද රු.736,242 ක වියදම් ණය හිමියන් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | උපයෝගී පොත්වල දක්වා තිබූ වයර්ලස් මවුස් 05 ක වටිනාකම වු රු.5,250, ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වන ලද ගිණුම් ශේෂ 06 ක ශේෂයන් ඊට අදාල උපලේඛණ වල සඳහන් ශේෂයන් සමඟ සැසඳීමේ දී රු. 4,597,687 ක වෙනසක් පැවතුණි. | 2024 මූල්‍ය ප්‍රකාශනය මඟින් නිවැරදි කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු 6,600,000 ක වත්කම් 04 කට අදාළ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2024 මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී ලබාදෙන තොරතුරු නිවැරදිව ලබාදිමට අවශ්‍ය කටයුතු කරන බව | සහා දේපල හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

---------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

--------------------------------------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අතුරු ව්‍යවස්ථා | | | |
| | 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 01 ඡේදය | ප්‍රාදේශීය සභාව විසින් 2020,2021 සහ ඉකුත් වර්ෂයේ සැප්තැම්බර් දක්වා ගාස්තු අයකර තිබුණු රු. 8,835,775 ක දැන්වීම් පුවරු 68 ක් සඳහා බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි | අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරන බව | අතුරු ව්‍යවස්ථා නියමයන් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු අයකරන ප්‍රදේශවල දේපළ තක්සේරුව වසර 05 කට වරක්වත් නැවත සිදුකළ යුතු වුවද සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපළ 2009 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි. | 2024 ජනවාරි මස සිට වරිපනම් බදු තක්සේරු කිරීම ආරම්භ කිරීමට කටයුතු කර ඇති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,001,479 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,234,153 ක් විය

2.2 ආදායම් පරිපාලනය

--------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2023 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,000,000 | 6,141,853 | 5,445,139 | 2,637,541 | 4,578,000 | 4,430,583 | 5,117,826 | 1,940,827 |
| (ii) | කඩ කුලී | 11,191,931 | 7,195,579 | 6,971,707 | 1,244,039 | 6,547,916 | 85,865,475 | 86,330,192 | 1,020,167 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,125,000 | 9,446,332 | 9,446,332 | - | 2,767,000 | 2,301,478 | 2,301,478 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,864,750 | 34,468,867 | 7,370,485 | 33,840,110 | 58,700,821 | 15,086,522 | 12,365,771 | 6,741,728 |
| | | 49,181,681 | 57,252,631 | 29,233,663 | 37,721,690 | 72,593,737 | 107,684,058 | 106,115,267 | 9,702,722 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් බදු<br>2008 සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මස දක්වා කාලය තුළ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අය විය යුතු රු.330,907 ක් හා වසර 05 ක කාලයක සිට පැවත එන පුද්ගලයන් 59 දෙනෙකුගෙන් අය කළ යුතු එකතුව රු. 281,958 ක වරිපනම් බදු අයකර නොතිබුණි. | වර්ෂයට අදාල ගාස්තු මේ වන විට ගෙවීම් කරමින් පවතින බව | හිඟ ආදායම් අය කළ යුතුය. |

(ආ) කුලී

------

| | | | |
|---|---|---|---|
| i. | 2018 වර්ෂයේ සිට අයවිය යුතු රු.80,187 ක නිවාස කුලී අයකර නොතිබුණි. | නිතීමය කටයුතු කර හිඟ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | සභාවේ කඩ කාමර සඳහා අයකරගත යුතු එක්වන් මුදල එකවර අයකර ගැනීම වෙනුවට වසර 05 කින් අය කිරීමට සභාව තීරණය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කඩ කාමර 22 කින් එකතුව රු.10,680,620 ක් අයකර ගෙන නොතිබුණි. | එක්වන් මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව | එක්වන් මුදල් අය කර ගත යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා ආඥා පනතේ 154 (1) වගන්තියට අනුව, ඉඩම් වෙන්දේසි කල සමාගම් 02 කින් ඉඩම් කොටස් කොටස් 20 කින් විකුණුම් වටිනාකම මත රු. 2,948,775 ක සියයට 01 ක බදු අයකර නොතිබුණි. | අයකර ගැනීම සඳහා අදාල සමාගම් වෙත දන්වා ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 88 ක ඉඩම්වල වර්තමාන හිමිකාරීත්වය අයදුම්කරුට පවතින බවට සනාථ කිරීමට පත්තිරු හා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. | පත්තිරු සටහන් ලබා ගැනීමට කටයුතු කරන අතර ඉදිරියේදී මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකු සහභාගි කරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව | සියලු අවශ්‍යතාවයන් සම්පූර්ණ කර අනුමත කළ යුතුය. |

3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් ගල් පිහිල්ල ඉඩමේ සහ ජල ටැංකිය සහිත ඉඩම හා සභාවේ මධ්‍යම බෙහෙත් ශාලාව අසල ප්‍රසිද්ධ වැසිකිළිය සහිත ඉඩම බාහිර පාර්ශව අනවසරෙන් අත්පත් කරගෙන තිබුණද ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩිමින් වත්කම් ආරක්ෂා කිරීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බව | සභා දේපල සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පැරණි නානුඔය කාර්යාලය අවට පිහිටා ඇති නානුඔය නිවාස යෝජනා ක්‍රමයේ නිවාස 06 ක් බාහිර පාර්ශවයන්ට ලබාදී තිබුණි. | කුලී හිමියන් සමඟ ගිවිසුම් අත්සන් කර නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කරන බව | සභා දේපල සුරක්ෂිත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | බ්ලැක්පූල් නිවාස යෝජනා ක්‍රමය තුළ පවතින නිවාසයක් හා සභාවට අයත් ප්‍රධාන ලිපිකරු රජයේ නිවාසය ඌන උපයෝජිතව පැවතුණි. | ආදායම් ලබා ගැනීමට හැකි දේපලක් නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන බව | උපයෝජනය කිරීමට කටයුත කළ යුතුය. |

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 අනුව සීමිත ලංසු කැඳවීමේදී සැපයුම්කරුවන්ගෙන් ලැයිස්තුවක් වෙත ලංසු කැඳවීම් සිදුකළ යුතු බවට දක්වා තිබුණද, ලියාපදිංචි නොවන සැපයුම්කරුවන් ගෙන් ලංසු කැඳවීම් කර රු.524,743 ක මිළදී ගැනීම් සිදුකර තිබුණි. | නිවැරදි කිරීමට පවත්නා වර්ෂයේ සිට කටයුතු කරමින් පවතින බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3. 16 (අ), (ආ), (ඇ) | 2024 වර්ෂයේ සිට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නියමයන්ගෙන් බැහැරව සභාව විසින් ඉදිරිපත් කළ පිරිවිතරයන්ගෙන් බැහැරව රු.370,000 කට පරිගණකයක් මිළදී ගෙන තිබුණි. | කරමින් යවත්කාලීනව විෂය කටයුතු සිදු කරන බව | |

3.4 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම ගිය සේවය අත්හිටවූ හා ස්ථාන මාරු වී ගිය නිළධාරීන් තිදෙනකුට ආදළ රු. 587,475 ක ණය ශේෂයන් වසර 02 ක කාලයක සිට අයකර නොතිබුණි. | හිඟ මුදල අය කරවා ගැනීම සඳහා කටයුතු කරන බව . | ආයතන සංග්‍රහයේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය |